# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/05/MF/01/චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2021.03.25 |

**මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 11 ට පස්වන එකතුව**

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි බැංකුපාලක මණ්ඩල/ බැංකු සමිති සභාපතිවරුන්,
සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු /බැංකු සමිති කළමණාකරුවන් ,

<u>ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ කළමනාකරුවන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා නිවාස ණය යෝජනා ක්‍රමය</u>

01. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පැවති අවස්ථාවේ දී ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා ක්‍රියාත්මක "නිවාස" ණය යෝජනා ක්‍රමයේ වාර්ෂික පොලි අනුපාතයන් සංශෝධනය කිරීමට සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ බැංකු සමිති කළමනාකරණ මණ්ඩල තිරණ අංක 2021/82/06. මගින් අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ඉදිරියට ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වු උපදෙස් ලබාදීමට මෙම නව එකතුව නිකුත් කරන බව දන්වමි.

02. 2021.04.01 දින සිට "නිවාස" ණය යෝජනා ක්‍රමයේ වාර්ෂික පොලි අනුපාතය 10% සිට 7.5% දක්වා අඩු කළ බව දන්වන අතර, ඒ අනුව පහත පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

2.1 නව පොලි අනුපාතයන් දැනට පිටහිටි ණය සඳහා වලංගු වේ.

2.2 නව පොලි අනුපාතය යටතේ මාසික ණය වාරිකය සකස් කිරිමේදී 2021 මාර්තු මසට අදාල චෙක්පත ලැබී ණය වාරිකය අඩු කල පසු 2021 අප්‍රේල් මස ඇති පිටහිටි ණය මුදලට පොලිය ගණනය කිරීම සිදු කල යුතුය.

2.3 ඒ අනුව, පිටහිටි ණයකරුවන්ගේ පිටහිටි ණය මුදල (රු) නව වාර්ෂික පොලි අනුපාතය සහ ගෙවීමට ඇති ගිවිසුම්ගත කාලය ඇතුලත් කර, නව මාසික වාරිකය සකස් කල යුතුය.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

ඒ සඳහා, මුල් චක්‍රලේඛයේ ඡේද අංක 03 හි උප ඡේද 3.4 හි සඳහන් ආකෘතිය භාවිතා කර, නව මාසික ණය වාරිකය සකස් කර ගත යුතුය. උදාහරණ :- යම් නිලධාරියෙකු රු. 500,000/- ණය මුදලක් මාස 120 තුල ආපසු ගෙවීමට ලබාගෙන 2021.04.01 දිනට පිටහිටි ණය මුදල රු. 141,152.96 ක් වේ. ණයගෙවීමට ඇති ඉතිරි ගිවිසුම් කාලය මාස 70 කි. ඒ අනුව ඇමුණුම් 01 හි සඳහන් පරිදි මාසික නව ණය වාරිකය රු. 2496/- ක් වේ.

2.4 ඉහත උපදෙස් පරිදි, මාසික ණය වාරිකය සකස් කල පත්‍රිකාවේ (Excel Sheets) පිටපතක් පුද්ගලික ණය ගොනුවට ඇතුලත් කිරීමට ද කටයුතු කරන ලෙස දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
4. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
6. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.